පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

"දිට්වා" ආපදා තත්ත්වය මත මධ්‍යම පළාත් සභාවේ ආයතන සඳහා සිදුවූ හානිය යථාවත් කිරීමට අතිරේක කාර්ය මණ්ඩලය ලබා ගැනීම

"දිට්වා" ආපද තත්ත්වය මත හානියට පත්වූ මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග තැවත යථාවත් කිරීම පිණිස පහත දැක්වෙන තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

තාක්ෂණ නිලධාරී (සිවිල්) - තනතුරු 08

- **මාසික දීමනාව :**

  JM 1-1 වැටුප් කේතයේ II ශ්‍රේණියේ ආරම්භක වැටුපට අදාළ වන පරිදි කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි. උපලේඛන අංක II හි සඳහන් පරිදි රු. 65,633/- ක් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 අනුව ජීවන වියදම් දීමනාව රු. 17,800/- ක් වන පරිදි මාසිකව රු. 83,433/- ක දීමනාවක් ගිමි වේ.

- **සුදුසුකම් (පහත සඳහන් 1 හෝ 2 හෝ 3)**

  1. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්ගි (NVQ-7) හත්වැනි මට්ටමට නොඅඩු මට්ටමක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

  2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්ගි (NVQ-6) හය වැනි මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (5) ක පළපුරුද්දක් ලබා තිබීම.

  3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්ගි (NVQ-5) පස්වැනි මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහයක (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

- **වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

- මාර්ග ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ සේවා පළපුරුද්ද සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

වැඩ පාලක තනතුරු 25

- **මාසික දීමනාව :**

  MA 1-1 වැටුප් කේතයේ III ශ්‍රේණියේ ආරම්භක වැටුපට අදාළ වන පරිදි කළමකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි. උපලේඛන අංක II හි සඳහන් පරිදි රු. 43,312/- ක් සහ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2024 අනුව ජීවන වියදම් දීමනාව රු. 17,800/- ක් වන පරිදි මාසිකව රු. 61,112/- ක දීමනාවක් ගිමි වේ.

- **සුදුසුකම්**

  (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

  i. සිංහල/ දෙමළ

  ii. ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04)ක් සඳහා සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම

  සහ

  (ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් (03) කින් එක්වර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

  (ඇ) ඉදිකිරීම් සම්බන්ධයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

- **වයස :** අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

- මාර්ග ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ සේවා පළපුරුද්ද සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

පොදු කොන්දේසි :

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
2. තනතුරට පැවරෙන කාර්යයන් ඉටුකිරීම සඳහා මෙම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
4. සෑම අයදුම්කරුවෙකුම තනතුරට බඳවා ගැනීම සඳහා අදාළ වන සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.
5. රජයේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරනු ලබන්නේනම් ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතුයි.
6. අයදුම්කරුවන් විසින් තමාගේ ජීවන දක්ත අඩංගු අයදුම්පත සකස්කර එවිය යුතු අතර, තමා පිළිබඳ තොරතුරු ලබා ගත හැකි ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සඳහන් කර එවිය යුතුය.
7. ඔබ විසින් යොමු කරනු ලබන අයදුම්පත්‍රයේ සඳහන්ව ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් නුසුදුස්සෙකු සේ සලකා ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.
8. අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

බඳවා ගන්නා ක්‍රමය :

- ඉහත සඳහන් සියලු තනතුරු සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්‍රණයක් මගින් බඳවා ගනු ලැබේ.

මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම. අයදුම්කරු මෙම තනතුර සඳහා පත් කිරීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් විසින් ජීව දක්ත විස්තර ඇතුළත් කර සකස් කරන ලද අයදුම්පත්‍ර අදාළ සහතිකවල පිටපත්ද (සහතික කරන ලද) සමග බහා එවනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කර 2026.12.04 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කළ යුතුය.

ඔබ එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම් කරන තනතුර සෑම අයදුම්පතකම සහ ලිපි කවරයේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

2026.12.04 දිනට පසු පසුව ලැබෙන අයදුම්පත්, අයදුම්පත් බහාලන ලිපි කවරයේ තනතුර සඳහන් කර නොමැති අයදුම්පත් අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලැබේ.

මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

සාමාන්‍යාධිකාරී,
පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,
මධ්‍යම පළාත.

Gazette.lk SINCE 1801 AMBITIONS REALIZED

පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,
අංක 09. ඇහැලේපොළ කුමාරිහාමි මාවත,
බෝගම්බර, මහනුවර.
දුරකථන අංකය 081-2204378